# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2090/34 – 2018 සැප්තැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා – 2018.09.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ පිරිපහදු නොකළ ජලය රැගෙන යාමට ජල නල එලීම සඳහා අමතර ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1410


1A – 28609 –17(2018/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 420 පොල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොණ්ඩදෙණිය ගමේ පිහිටි කොටුවගාවහින්න නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 04 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් 02 :–

**කැබලි අංක 01**

*උතුරට* : ජේ. කේ. එස්. ජයවර්ධන මහත්මිය (66/4, ගොහාගොඩ පාර, කටුගස්තොට) හා පත්තිනි දේවාලය හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මූලික පිඹුරුපත මහ 5851 හි කැබලි අංක 1, 2 සහ 3

ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය: 01. බස්නායක නිලමේතුමා
ශ්‍රී මහා පත්තිනි දේවාලය, මහනුවර.

02. ඉන්ද්‍රාණී ෆොන්සේකා මහත්මිය,
69/1 A, ගොහාගොඩ පාර, පොල්වත්ත,
කටුගස්තොට.

සහ තවත් අය.

**කැබලි අංක 02**

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : ඉන්ද්‍රාණී ෆොන්සේකා මහත්මිය (69/1 A, ගොහාගොඩ පාර, කටුගස්තොට) හා පත්තිනි දේවාලය හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : මූලික පිඹුරුපත මහ 5851 හි කැබලි අංක 1 සහ ප්‍රාදේශීය සභා පාර,

ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය: 01. බස්නායක නිලමේතුමා
ශ්‍රී මහා පත්තිනි දේවාලය, මහනුවර.

02. ජේ. කේ. එස්. ජයවර්ධන මහත්මිය,
66/4, ගොහාගොඩ පාර, පොල්වත්ත,
කටුගස්තොට.

සහ තවත් අය.

10 - 352

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.